# බඩඉරිඟු වගාව ප්‍රවර්ධනය කළ හැක්කේ කෙසේද




**ඒ. ටී. සූරියආරච්චි**

ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය,
මහඉළුප්පල්ලම

**එච්. යූ. වර්ණකුලසූරිය**
**ටී. එච්. සී. එස්. පෙරේරා**

සමාජ ආර්ථික සැලසුම් මධ්‍යස්ථානය - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව


වී වගාව සඳහා වාරි ජල සම්පාදන පහසුකම් ප්‍රමාණවත් නොවූ වියළි කලාපීය ප්‍රදේශ වල ගැමි ජනතාවගේ ආහාර සුරක්ෂිත තාවය සලසන්නා වූ ඉතා වැදගත් බෝගයක් වූයේ බඩඉරිඟුය.

එමෙන්ම ශ්‍රී ලංකාවේ ඒකපුද්ගල ආදායම ඉහල යාමත් සමග කුකුල්මස් පරිභෝජනය සැලකියයුතු මට්ටමකින් ඉහල ගොස් ඇති බැවින් සත්ව ආහාර නිෂ්පාදනය සඳහා බඩඉරිඟු වල ඉල්ලුමද ඉහල ගොස් ඇත.

2009 වසරේ සිට 2013 වසර දක්වා පසුගිය පස් වසරක කාලය තුල වගා වපසරිය හෙක්ටයාර 50,857 සිට 67,372 ක් දක්වා වැඩි වී ඇති අතර, බඩඉරිඟු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 78,500 කින් ඉහල ගොස් ඇත. ඒ අනුව එම කාලය තුල බඩඉරිඟු අපනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 27,000 කින් අඩු වී ඇත.

නමුත් වර්තමානයේ සත්ව ආහාර නිෂ්පාදනය සඳහා පමණක් බඩඉරිඟු අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් 400,000 ක් පමණ වේ.

ඒ අනුව වැඩි වන බඩඉරිඟු ජාතික අවශ්‍යතාවයට සරිලන බඩඉරිඟු නිෂ්පාදන ඉලක්කයක් කරා යෑමේ අභියෝගය ජය ගැනීමට ගොවි ගැටළු හා අවශ්‍යතාවයන් හඳුනාගෙන ගොවීන්ගේ අදහස් මත පාදක වූ නිෂ්පාදන සැලසුම් සකස් කිරීම ඉතා වැදගත් වේ.

මෙම අධ්‍යනය මඟින් බඩඉරිඟු වගාව කරන ගොවීන්ට ඇති ගැටළු හා දුෂ්කරතාවයන් හඳුනා ගැනීමත් ගොවීන් විසින් බඩඉරිඟු වගාව ව්‍යාප්ත කිරීමට කරනු ලබන යෝජනා හා අවශ්‍ය කරන ප්‍රතිපත්ති සැකසීමට රජයේ මැදිහත් වීම පිළිබඳවත් විශ්ලේෂණය කිරීම සිදු කරයි.

ශ්‍රී ලංකාවේ බඩඉරිඟු වගාවෙන් 53% ක් අනුරාධපුර දිස්ත්‍රික්කය සහ බදුල්ල දිස්ත්‍රික්කය තුල ව්‍යාප්තව ඇත. ඒ අනුව මහ කන්නයේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළද, යල කන්නයේ බදුල්ල දිස්ත්‍රික්කය තුළද, ප්‍රධාන වශයෙන් බඩඉරිඟු වගා කෙරේ.

මෙම අධ්‍යනය අනුරාධපුර සහ බදුල්ල දිස්ත්‍රික්ක තුල 2012 යල හා 2012/13 මහකන්නය තුල සිදුකර ඇත.

2013 වර්ෂයේ නිෂ්පාදන වියදම් සමීක්ෂණ දත්ත වලට අනුව වී, එළවළු සහ සෙසු අතිරේක ආහාර බෝග වලට සාපේක්ෂව බඩඉරිඟු අඩු ආර්ථික ඵලදායීතාවයක් පෙන්නුම් කරයි. එය ගොවීන් අතර බඩඉරිඟු වගාව ව්‍යාප්ත කිරීමට බාධාවක්ව ඇත. බඩඉරිඟු සඳහා අඩු ගොවිපල මිලක් ලැබීම, ඉහල නිෂ්පාදන වියදම හා අලෙවි කිරීමට ඇති දුෂ්කරතාවයන් ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටළු වේ.

බඩඉරිඟු ගොවීන් ගෙන් 78% ක් සිය අස්වනු ග්‍රාමීය හා නාගරික පෙදෙස් වල එකතු කරන්නන් හා වෙළඳුන් වෙත අලෙවි කිරීම සිදු කරයි.

සමීක්ෂණයට ලක්වු ගොවීන්ගෙන් 96% කට ගබඩා පහසුකම් නොමැති අතර 98% කට බඩඉරිඟු සැකසීමේ පහසුකම් නොමැත.

බඩඉරිඟු වල ගොවිපල මිල මහ කන්නය තුළ රු. 27/- ක් ද, යල කන්නය තුල රු. 30/- ක් ද, වන බව සමීක්ෂණයෙන් අනාවරණය වු අතර ගොවීන් 67% ගේ මතය වුයේ දැනට ලැබෙන මිල ප්‍රමාණවත් නොමැති බවයි. ගොවීන්ගෙන් 92% ක් ස්ථාවර මිලක් අපේක්ෂා කරයි.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහකන්නයේ අස්වැන්න හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 4.9 ක් ද, ආදායම හෙක්.ට රු. 145,547 ක් ද, වන අතර යල කන්නයේ අස්වැන්න හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 3.58 ක් සහ ආදායම හෙක්ටයාරයට රු.110,941 ක් වේ. බදුල්ල දිස්ත්‍රික්කයේ මහ කන්නයේ අස්වැන්න හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 3.38 ක් ද, ආදායම හෙක්ටයාරයට රු. 87,380 ක් ද, වන අතර යල කන්නයේ අස්වැන්න හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 3.75 ක සහ ආදායම හෙක්ටයාරයට රු. 103,172 ක් වේ.

නිෂ්පාදන වියදම සලකා බැලූ විට, අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා මහ කන්නයේ හෙක්ටයාරයට රු 67,914 ක් ද, යල කන්නයේ හෙක්ටයාරයට රු. 80,299 ක් ද, වන අතර බදුල්ල දිස්ත්‍රික්කය සඳහා මහ කන්නයේ හෙක්ටයාරයට රු. 63,055 ක් ද, යල කන්නයේ හෙක්ටයාරයට රු. 78,327 ක් ද, වේ.

බිම් සැකසීම, පැළ සිටුවීම, වල් මර්ධනය හා අස්වනු නෙලා සැකසීමට මහ කන්නයේ නිෂ්පාදන වියදමින් 66% ක් ද, යල කන්නයේ නිෂ්පාදන වියදමින් 57% ක්ද, යෙදවෙයි. නිෂ්පාදන වියදම පියවා ගැනීම දැනට පවතින අස්වැන්න අනුව අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා යල කන්නයේ හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 2,676 ක අස්වැන්නක්ද, මහ කන්නයේ හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 2,744 ක අස්වැන්නක්ද, බදුල්ල දිස්ත්‍රික්කයේ මහකන්නයේ හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 2,618 ක අස්වැන්නක්ද, යල කන්නයේ හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 2,335 අස්වැන්නක්ද, ලබාගත යුතුය.

සමීක්ෂණය අනුව, බඩඉරිඟු කිලෝ ග්‍රෑමයක් සඳහා නිෂ්පාදන පිරිවැය අනුරාධපුර දිස්ත්‍රික්කයේ යල කන්නය සඳහා කිලෝග්‍රෑමයට රු. 22.42 ක් ද,